පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය : පෙරදිග සංගීතය

සතිය : 04 වන සතිය

ශ්‍රේණිය : 06

සකස් කිරීම : ධනුෂ්ක සෙනවිරත්න.
කෑ/මාව/ගබ්බල සිරිසඟබෝ ම.වි. (මාවනැල්ල කලාපය)

Department of Education,Sabaragamuwa Province/ Weekly School

# ස්වර ස්ථාපන ගීත ගායනය

6 ශ්‍රේණියේදී සංගීත විෂය ශාස්ත්‍රයක් ලෙස හදාරන්න බලාපොරොත්තුවන ඔබ ස්වර ස්ථාපන ගී ගායනා කළයුතු වන්නේ ඇයි.......

- ✓ ශුද්ධ ස්වර ඉතා හොඳින් ගායනය කිරීම සඳහා
- ✓ ආරෝහණ හා අවරෝහණ වශයෙන් ස්වර සප්තකය ගායනය සඳහා
- ✓ ස්වර අන්තරයන් (සමීප ස්වර දෙකක් අතර ඇති දුර/වෙනස)හඳුනා ගැනීම සඳහා
- ✓ ගීත ගයමින් හොඳ රසවින්දනයක් ලබාගැනීම සඳහා

➡ පළමුව ගී පද හොඳින් ගායනා කළ පසුව ස්වර ප්‍රස්තාරය ගායනා කරන්න.

➡ පහත දැක්වෙන ස්වර ස්ථාපන ගීත සෘති ස්වරයේ සිට අඩු පරාසයකින් අරඹා වැඩි පරාසයක් දක්වා ස්වර විහිදීම ක්‍රමයෙන් සිදුවන ලෙස ගොඩනගා ඇත.

**1. හොඳ දේ හිතමී – “ ස ” සිට “ රි ” දක්වා**

**2. ගී ගයන මේ කුරුළු යාලුවන් හා – “ ස ” සිට “ රි ” දක්වා**

**3. ඈත ආකහේ – “ ස ” සිට “ ග ” දක්වා**

**4. එකට සතුටු සාගරේ – “ ස ” සිට “ ම” දක්වා**

**5. කඳුපෙල අතරේ – “ ස ” සිට “ ප ” දක්වා**

**6. කඳු කඳු නැගෙනා – මන්ද්‍ර ස්වර පුහුණුව**

**7. මුනිසිරි පාදේ – “ ස ” සිට “ උච්ච ස ” දක්වා**

**8. ඈත ඈදී යලි මෑතට පාවේ – “ මන්ද්‍ර ධ ” සිට “ උච්ච ස ” දක්වා**

**9. බැතිනා සිරිපා කරුණා – ආරෝහණ අවරෝහණ ස්වර ගායනය**

**10. ඈත හිමේ ගිරිමුදුනේ – ස්වර අභ්‍යාස රටා ගායනය**

ස්වර පුවරුවෙන් වාදනය කිරීමේදී ස ස්වරය සඳහා දකුණු අතෙහි මහපටැඟිල්ල ද, රි ස්වරය සඳහා දබරඟිල්ල ද, ග ස්වරය සඳහා මැදැඟිල්ල ද, ම ස්වරය සඳහා නැවතත් අනෙක් ඇඟිලි යටින් මහපටැඟිල්ල ද වාදනය කරන්න.

වින්සන්ට් සෝමපාල ගුරින්ගේ නිර්මාණයකි.

ස ස්වරයේ සිට ම ස්වරය දක්වා ස්වර යොදාගෙන ඇත.

| | | | |
|---|---|---|---|
| ස ස ස | රි රි රි | ග - රි | ස - - |
| එ ක ට | ස තු ටු | සා S ග | රේ S S |
| ස - ස | රි - රි | ග - ග | ම - - |
| පී S න | පී S න | නාSන | සේ SS |
| ම - ම | ග - ග | රි - රි | ස - - |
| සෑ S ම | දා S ම | මේSලෙ | සේ SS |
| ස රි ග | ම - - | ම ග රි | ස - - |
| න ව මු | ගී S S | ග ය ග | යා S S |

| | | | |
|---|---|---|---|
| ස ස ග ග | රි රි ග - | ස ස රි රි | ග - - - |
| ක ඳු පෙ ළ | අතරේ s | තු රු ව ඳු | ලේ s s s |
| ස - රි - | ග - ම - | ග - රි - | ස - - - |
| ග ං ගා s | වේs හාs | වෙල්යාs | යේ s s s |
| ප - ප - | ම - ප ම | ග - ම ග | රි - - - |
| ගී s නා s | දේsගැමි | යා s ම ව | නා s s s |
| ස රි ග ම | ප - - - | ප ම ග රි | ස - - - |
| සු ම ධු ර | වේ s s s | ම න හ ර | වේ s s s |

ස ස්වරයේ සිට ප ස්වරය දක්වා විහිදී ඇත

| | | | |
|---|---|---|---|
| ස ස ග - | රි රි ම - | ග ග ප - | ම ධ ප - |
| බැ ති නා s | සි රි පා s | ක රු ණා s | ක ර නා s |
| ප ප නි - | ධ ධ ස් - | නි නි ධ ප | ධ නි ස් - |
| තු ටි නා - | බු දු ගී s | ග ය නා s | ජ න යා s |
| ස් - ධ - | නි - ප - | ධ - ම - | ප ම ග - |
| සා s ඳූ s | සා s ඳූ s | නා s දේ s | අ ත රේ s |
| ස රි ග ම | ප ධ නි ස් | ස් නි ධ ප | ම ග රි ස |
| ඉ හ ළ ට | නැ ඟ ය ති | ප හ ළ ට | බැ ස එ ති |

ආරෝහණ හා අවරෝහණ රටාවට නිර්මාණය වී ඇති ස්වර ස්ථාප ගීයකි.

**<u>පහත සඳහන් ප්‍රකාශ සත්‍ය නම් ✓ ලකුණ ද අසත්‍ය නම් ✕ ලකුණ ද යොදන්න.</u>**

1. ස්වර ස්ථාපන ගීත ගායනය මගින් ස්වර ඥානය වර්ධනය කරයි. ( )
2. ස්වර සප්තකය ගායනය පුහුණුවීමට ස්වර ස්ථාපන ගීත වැදගත් නොවේ. ( )
3. ස්වර ස්ථාපන ගීත ගායනය තුළින් ස්වර අන්තරයන් හඳුනාගත නොහැක. ( )
4. ස්වර ස්ථාපන ගීත ගායනයෙන් හොඳ රසවින්දනයක් ලැබේ. ( )
5. මෙම ස්වර ස්ථාපන ගීත සෘතී ස්වරයේ සිට අඩු පරාසයකින් අරඹා වැඩි පරාසයක් දක්වා ස්වර විහිදෙන අයුරින් නිර්මාණය කර ඇත. ( )
6. එකට සතුටු සාගරේ යනු වින්සන්ට් සෝමපාලයන්ගේ නිර්මාණයකි. ( )
7. කඳු කඳු නැගෙනා ගීතයේ ස ස්වරයේ සිට ප ස්වරය දක්වා ස්වරයන් විහිදී ඇත. ( )
8. ස ස්වරයේ සිට ම ස්වරය දක්වා ස්වරයන් එකට සතුටු සාගරේ යන ගීතයෙන් ස්ථාපනය කෙරේ. ( )
9. “ගී ගයන මේ කුරුළු යාළුවන් හා” ස්වර ස්ථාපන ගීතයක් නොවේ. ( )
10. “බැතිණා සිරිපා කරුණා කරනා”යන ස්වර ස්ථාපන ගීතය ආරෝහණ හා අවරෝහණ රටාවකින් නිර්මාණය වූ ගීතයකි. ( )